මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
**Central Environmental Authority**
පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk

අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/FPR/37/2021 ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. දිනය / திகதி / Date 2021.03.04

## මාධ්‍ය නිවේදනය

### කලවාන - දෙල්ගොඩ සංරක්ෂණ වනාන්තරයට ආසන්න කැලෑ ඉඩමක් එළිකිරීමට එරෙහිව මධ්‍යම පරිසර අධිකාරිය පියවර ගෙන ඇත.

කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැවගම ග්‍රාම නිලධාරී වසමේ දෙල්ගොඩ සංරක්ෂණ වනාන්තරයට ආසන්නව පිහිටා ඇති, රජයට අත්කර ගැනීමට දැන්වීම් ප්‍රසිද්ධ කරනු ලැබූ ඉඩමක කැලෑ එළිකිරීමට එරෙහිව මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික පාරිසරික පනත අනුව පියවර ගනී.

මෙම සිදුවීමට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කළ ආකාරය පිළිබඳව පහත දක්වා ඇත.

අදාළ සිදුවීම සම්බන්ධයෙන් 2021.02.19 වන දින මධ්‍යම පරිසර අධිකාරියේ සබරගමුව පළාත් කාර්යාලය මගින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී. ඒ අනුව පහත කරුණු අනාවරණ විය.

- අදාළ ප්‍රදේශය පෞද්ගලික හිමිකරුවන් දෙදෙනෙකුට අයත්වන අතර අක්කර 5 සහ අක්කර 17 බැගින්වන ඉඩම් වේ. ඒවා, සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැවගම ග්‍රාමනිලධාරී වසමේ පුහුල්පැල්පොළ ගොවිපොළ මාර්ගය ආසන්නයේ රජයට අත්කර ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයක පිහිටා ඇත.
- අක්කර 5 ඉඩම ස්වාභාවික වනාන්තර සහ කෘෂිකාර්මික භූමි පරිහරණ රටාවක් ඇති ප්‍රදේශයක පිහිටා ඇති බවත් අදාළ ඉඩම වටා ස්වාභාවික වනාන්තරයක් පවතින බවත්, අක්කර 17 ඉඩම ස්වාභාවික වනාන්තර සහ කෘෂිකාර්මික භූමි පරිහරණ රටාවක් ඇති ප්‍රදේශයක පිහිටා ඇති බවත් අදාළ ඉඩම තේ වගාවන් හා ස්වාභාවික වනාන්තරවලින් සමන්විතවන බවත් නිරීක්ෂණය විය.
- අක්කර 5 සහ 17 ඉඩම් පිළිවෙළින් අංශක 30-40ක සහ 30-70ක පමණ බෑවුමකින් යුක්තය.
- අක්කර 5 ඉඩමේ අක්කර 2.5ක පමණ ප්‍රදේශයක විශාල ශාක 30-40ක් පමණ කපා හෙළා ගිනි තබා ඇති බවත් ඉඩමේ ස්ථාන කිහිපයකම විශාල ගස් කපා හෙළා ගිනි තබා වගා කටයුතු සඳහා භූමිය සකස් කර ඇති බවත් පරීක්ෂා කරන අවස්ථාවේ දැක ගත හැකි විය.
- එලෙසම අක්කර 17 ඉඩමේ එක් ස්ථානයක කුඩා ජලාශයක් පිහිටා ඇති අතර එම ජලාශයේ සිට පහළට ගලා බසින දොළ පහරක් පවතින බවත් ඉඩමේ පිහිටි දොළ පහරේ දකුණු පස ඉවුර දක්වාම ඒ ආසන්නයේ පිහිටි සියලුම ශාක කපා භූමිය එළි පෙහෙළි කර ඇති බවත් නිරීක්ෂණය විය.

2021.02.22 දිනැති ලිපි මගින් කලවාන ප්‍රාදේශීය ලේකම්තුමා වෙත සහ කලවාන පොලිස් ස්ථානාධිපතිතුමා වෙත මේ පිළිබඳ දන්වා ඇත. රජයට අත්කර ගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කර ඇති ඉඩමක සංවර්ධන කටයුතු සිදු කර ඇති බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 02වන වගන්තිය යටතේ



| Chairman | Tel : 2872361, 2872348<br>Fax : 2872347 | Director General | Tel : 2872359<br>Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2873448<br>7877277-280 | Complaint : 2888999 |
|---|---|---|---|---|---|---|

| Deputy Director Generals | HRD. Admin. & Finance<br>Tel : 2865296 Fax : 2877515 | Envt. Pollution Control<br>Tel :2873453 Fax : 2872605 | Envt. Mgt. & Assess.<br>Tel : 2872388 Fax : 2872296 | Envt. Edu. & Awareness<br>Tel : 2872297 Fax : 2872609 | Waste Mgt.<br>Te: 2872409 Fax: 2882152 |
|---|---|---|---|---|---|





මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு | Ministry of Mahaweli Development & Environment

අදාළ ආයතනවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරන ලෙස උක්ත ලිපි මගින් ඔවුනට දන්වා ඇත.

එලෙසම අදාළ ඉඩම් හිමියන් වෙත එළිපෙහෙළි කිරීම් වහාම නවත්වන ලෙස ලිපි මගින් මධ්‍යම පරිසර අධිකාරිය දන්වා ඇත.

ජාතික පාරිසරික පනත ප්‍රකාරව ක්‍රියාකරමින්, ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක පරිසර හානියක් සිදුනොවන ලෙස පරිසරය රැකගැනීමේ වගකීම ඉටුකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය නිරන්තරයෙන්ම කටයුතු කරයි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය